

# පෙර පාසල් ජාතික සැලසුම


අධ්‍යාපන අමාත්‍යංශයේ වැ.බ.අධ්‍යක්ෂිකා
**හද්‍රා විතාන**

රටක වගකීමෙන් සුරැකිය යුතු අගනාම පරපුර වන්නේ ළමා පරපුර යි. "හැඳි නොගා හදන කිරි හොද්දත්" "අයාලේ හැදෙන දරුවාත්" දෙකම එකයැයි අපේ පැරණි කතාවක් තිබේ. එසේම දරුවකු යහපත් වන්නේ නිසි මඟ පෙන්වීමකින් හා ආදරය සෙනෙහස රැකවරණය මැද කල්ගෙවන විට දී ය.

යහපත් පුරවැසියකු සමාජයට දායාද කිරීම වැඩිහිටි පරම්පරාවේ යුතුකමක් ලෙස සැලකෙන්නේ එළෙසිනි. මුල් ළමා විය ගත කර පාසල් අධ්‍යාපනයට හා බාහිර ක්‍රියාකාරකම්වලට අවතීර්ණවන දරුවා දක්ෂයකු හෝ පසුගාමී දරුවකු හෝ වන්නේ ළදරු වියේ දී පමණක් නොව මව් කුසේ සිටියදී පවා ලබන යහපත් අත්දැකීම් හා චර්යාවන් තුළින් බව අධ්‍යාපන විශේෂඥයන් හෙළිදරව් කරගත් කරුණු කාරණා අතර වේ. කොටින්ම කිවහොත් යහපත් මෙන්ම සාඵල්‍යතාවෙන් පරිපූර්ණ පුරවැසියකු බිහිවන්නේ එවිට ය.

ළදරු වියේ දී ලබන මිහිරි හෝ අමිහිරි කටුක අත්දැකීම් මත කවරකු ගේ වුවද අනාගතය තීරණය වන බව වර්තමානයේ දී පෙනී ය කරුණකි. තරුණයකු වැඩිහිටියකු වූ පසුව ඔහු තම ජීවිතය හැඩගස්වා ගැනීමට ළදරුවියේ දී හා ළමාවියේ දී ලත් අත්දැකීම් උපයෝගී කොට ගනියි.

මේ නිසා මුල් ළමා විය රැකගැනීම හා සංවර්ධනය කිරීම යනු ආවාට ගියාට නොකළහැකි මෙන්ම නොකළ යුතුද වැදගත් කාර්යයභාරයකි. මල් පොහොට්ටුවක් මෙන් ලෝකයට ජනිතවන දරුවා කායික හා මානසික වශයෙන් මනා පෝෂණයකින් යුතුව



අනාගතයට සූදානම්කර තැබීම වර්තමානයේ දී අප ඉදිරියෙහි ඇති බරපතල වගකීමක් වනවාට සැක නැත.

කෙසේ වුවද මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය නැංවීම පිළිබඳ ජාතික සැලැස්මක් මේ වන විට හඳුන්වාදීමට රාජ්‍ය අනුග්‍රහයෙන් තීරණය කර තිබීම,

සැබැවින් ම පුරවැසියන් ලෙස අප සැම ගේ සතුටට හේතුවක් වන බව කිව යුතුය.

යුනෙස්කෝව මැදිහත්ව 2001 අප්‍රේල් මස 10,11, 12 යන දිනවල දී සෙනගාලයේ ඩකා නුවර දී දකුණු ආසියානු කලාපීය රටවල් 164 ක අධ්‍යාපන ඇමැතිවරුන්ගේ සහභාගිත්වයෙන් පැවැති මෙම සමුළුවේ දී යෝජනා කරගත් පරිදි මෙම ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මේ වන විට කාර්ය සාධක බලකායක් ද පිහිටුවා ඇත.

මේ අයුරින් මෙම මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සැලැස්මේ මූලික පසුබිම වන්නේ , අධ්‍යාපනය මානව අයිතිවාසිකමක් වන අතර ම, ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට නම්, දිළිඳු කම පිටු දැකීමයි. දිළිඳුකම පිටු දැකීම තුළින්, ඒ හා සබැඳිව හඹා එන අනෙකුත් ගැටලු සමනය වන බව ඔවුන් ගේ දැක්මයි.

"සැමට අධ්‍යාපනය" යන්න මෙම සැලසුම් සංකල්පයේ තේමාව වී ඇත. මෙහි දී නාගරික හා ග්‍රාමීය දිළිඳු ජනතාවගේ අධ්‍යාපනයෙහි ගුණාත්මක බව වර්ධනය කෙරෙහි අවධානය යොමුවන අතර, දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපෑම් කරන අනෙක් ප්‍රධාන සාධකයන් වන්නේ සෞඛ්‍යය හා පෝෂණයයි.

රටට සම්පතක් වූ බුද්ධිමත් උගත් දක්ෂ දරුවන් බිහිවීමට නම් දරුවකු වටා ඇති පසුබිමෙහි ආංශික වර්ධනයන් ද ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා වෙසෙසින්ම බලපාන තවත් සාධක අතර වේ. අධ්‍යාපනය හා සබැඳි දරුවකු ගේ පසුකාලීන වර්ධනයට බලපාන ජීවන කුසලතා තුළින් දීප්තිමත් දරුවකු බිහිවන්නට නම්, එකී අංශවල මනා සංවර්ධනයක් ද තිබිය යුතුමය.

මෙම සැලසුමේ වැඩි වගකීමක් හා කාර්යභාරයක් අධ්‍යාපන අමාත්‍යාංශයට දැරීමට සිදුවූවත්, සැලසුම ක්‍රියාත්මක කිරීමේ දී පවත්නා පුළුල් ක්‍රියාවලිය තුළ, තවත් විවිධ අමාත්‍යංශ හා ආයතන රාශියක් ද ව්‍යාපෘතියට සුවිශේෂ මෙහෙවරකින්

රටට සම්පතක් වූ බුද්ධිමත් උගත් දක්ෂ දරුවන් බිහිවීමට නම් දරුවකු වටා ඇති පසුබිමෙහි ආංශික වර්ධනයන් ද ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා වෙසෙසින්ම බලපාන තවත් සාධක අතර වේ. අධ්‍යාපනය හා සබැඳි දරුවකු ගේ පසුකාලීන වර්ධනයට බලපාන ජීවන කුසලතා තුළින් දීප්තිමත් දරුවකු බිහිවන්නට නම්, එකී අංශවල මනා සංවර්ධනයක් ද තිබිය යුතුමය.

දායක වීමට යෝජිතය. ඒ පෝෂණ, සෞඛ්‍ය, සනීපාරක්ෂක හා සමාජීය වශයෙනි.

මේ අනුව ලෝකයේ නියෝජිතයන් 164 දෙනකු සහභාගි වී ඇතිකරගත් 'ඩකා සම්මුතිය' අනුව සැමට අධ්‍යාපනය පිළිබඳ සමස්ත ජාතික සැලසුම් සැලකීමේ වැදගත්කම මෙහිදී අවධාරණය කර ඇත.

ඒ අනුව පියවර තුනකින් යුතුව, 2005 වනවිට අපේක්ෂිත අරමුණ කරා ළඟාවීමට බලාපොරොත්තු වෙයි.සෙනගාලයේ 'ඩකා' නුවර දී ඇති කර ගත් සම්මුතියට අනුව ප්‍රධාන අරමුණු මෙලෙසය.

* මුල් ළමා විය රැකවරණය හා අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම. විශේෂයෙන් ම අවාසි සහගත සහ අසරණ වූ දරුවන් වෙනුවෙන් අවධානය යොමු කිරීම
* වසර 2015 වන විට ප්‍රාථමික පාසල් යායුතු වයසේ පසුවන සියලු දරුවන්ට අධ්‍යාපන අවස්ථා සැලසීම සහ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම.
* තරුණ සහ වැඩිහිටි පරපුර තුළ ජීවන කුසලතා හා ජීවන නිපුණතා සංවර්ධනය හා යාවජීව අධ්‍යාපනයක් ලබා දීම.
* වසර 2015 වන විට වැඩිහිටි සාක්ෂරතා මට්ටම 50% දක්වා සංවර්ධනය කාන්තාවන් සහ අසරණ පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම.
* ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ලබාදීමේ දී ස්ත්‍රී / පුරුෂ විෂමතා දුරු කිරීම
* සැමටම ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම

* උක්ත අරමුණු කරා ළඟාවීමට, සුවිශේෂී පොදු අරමුණු උපාය මාර්ගවලින් යුතු, විධිමත් සම්බන්ධීකරණ හා නියාමන ක්‍රියාවලි සහිත අංශ හා ආයතන සම්බන්ධවන, පළාත් සහ ගම් මට්ටම් දක්වා ප්‍රසාරණය වූ ජාතික සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත යි.

සැමට අධ්‍යාපනය යන සංකල්පය යටතේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය

**01. මුල් ළමාවිය රැකවරණය හා අධ්‍යාපනය.**

* ළදරුවන් ගේ හා පෙර පාසල් දරුවන් ගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීම
* පෙර පාසල් අධ්‍යාපන ප්‍රවේශ මට්ටම 60% සිට 100% දක්වා 2015 වන විට වර්ධනය කිරීම.
* විධිමත් අධ්‍යාපනය සඳහා සාර්ථක පදනමක් ඇති කිරීමට වැඩසටහන් සකස් කිරීම


**02. තරුණ හා වැඩිහිටි සාක්ෂරතාව නැංවීම.**

* වැඩිහිටි සාක්ෂරතාව නැංවීම
* තරුණ හා වැඩිහිටි පරපුර අතර කාර්යබද්ධ සාක්ෂරතා වර්ධනය
* තාක්ෂණික හා ප්‍රායෝගික කුසලතා වර්ධනය.

මුල් ළමා විය රැකවරණය හා අධ්‍යාපනය යටතේ ඒ හා අත්වැල් බැඳගත් තවත් සුවිශේෂී කරුණක් ලෙස පෙන්වා දෙන්නේ වැඩිහිටි සාක්ෂරතාව සංවර්ධනය කිරීමයි. සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාවේ මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ සැලැස්මේ දී වැඩි කාර්යභාරයක් මෙන්ම වගකීමක් දැරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට සිදු වේ.

එසේ වුවත් ප්‍රතිපත්ති සැකසීමෙහිලා තවත් අමාත්‍යාංශ හා ආයතන මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන බොහොමයක් ඒ සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමට සැලසුම් යොදා ඇත.

මෙහි දී පෙර පාසල් අධ්‍යාපනය හා පුහුණු කිරීම් සම්බන්ධයෙන් පිළිගත් ප්‍රමිතියක් මත තම කාර්යභාරය ඉටු කිරීමට සුදානමින් විවෘත විශ්ව විද්‍යාලයය මෙහි වැදගත් අංශයක් නියෝජනය කරයි. වැඩිහිටි සාක්ෂරතාව ඉහළ මට්ටමක පවතිතැයි අප සිතුවත් ඒවායේ මිනුම් දඬු කොතරම් දුරට සාර්ථකදැයි විමසා බැලිය යුතුව ඇත.



මුල් ළමා විය සංවර්ධනය සඳහා, සෞඛ්‍යය, පෝෂණය, මෙන්ම සමාජීය හා පවුල් පසුබිම ද, ළමා සංවර්ධනයට තදබල ලෙස බලපෑම් කරන සාධක අතර වේ. එලෙසම මාපියන්, වැඩිහිටියන් තුළ ඇති කළ යුතු අධ්‍යාපනික සංවර්ධනය යහපත් දරුවකු නිර්මාණය කිරීමෙහිලා අතිශය වැදගත් මූලාශ්‍රයක් වන බව පැහැදිලිය.

දරුවන් තුළ ඇතිවන මානසික වියවුල්, පෝෂණ හා සෞඛ්‍යමය ගැටලු මෙන්ම බාහිර සමාජයෙන් දරුවන්ට සිදුවන හිරිහැර අපචාර වැනි දේ අවම කර ගැනීම විඩිහිටියන් දැනුවත් කිරීම තුළින් අපේක්ෂා කරන වක්‍ර ක්‍රමෝපායන් ලෙස දැක්විය හැකි ය.

**ඒ අනුව මෙම ජාතික සැලසුමට සහයවන ආයතන**

* පළාත් අධ්‍යාපන නිලධාරීන් හා පළාත් සෞඛ්‍ය නිලධාරීන්
* සෞඛ්‍ය අමාත්‍යයංශය
* සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යංශය
* ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යංශය
* ජනමාධ්‍ය අමාත්‍යංශය
* නැවත පදිංචි කිරීමේ හා මානව අයිතිවාසිකම් පිළිබඳ අමාත්‍යංශය
* රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය
* ජාතික අධ්‍යාපන ආයතනය
* සමෘද්ධි අමාත්‍යංශය
* ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
* ජාතික අධ්‍යාපන කොමිසම
* යුනිසෙෆ් යුනෙස්කෝ ඇතුළු ආධාර දෙන වෙනත් ආයතන.

වෂී 2015 වන විට ළඟාවිය හැකි යැයි අනුමාන කරන ඉලක්කය මේ තුළින් අපේක්ෂා කරනු ඇත. කෙසේ වුවද යහපත් පූර්ව දැක්මක් හා සූදානමකින් යුතුව මෙම සැලසුම ක්‍රියාත්මක කිරීමට හැකිවුවහොත්, ජාතියේ වටිනාම සම්පතවන හසළ බුද්ධියෙන් පිරිපුන්, නිරෝගී අගනා දක්ෂ දරු පරපුරක් රටට තිළිණ කිරීමට අපට හැකිවනු නොඅනුමානය.

එකිනෙකාට මානුෂික දයාව, කරුණාව, ආදරය තිළිණ කළ හැකි පාරිශුද්ධ සමාජයක් මතු දිනක ගොඩනැංවිය හැක්කේ සුන්දර ළමා වියක මෙවන් වූ ඇරඹුමක් සමඟ බව අප සිහිකළ යුතු කරුණකි.

**සටහන**

**නන්දි අලුත්ගේ රත්නවීර**